# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,446 - 2025 ජූලි මස 18 වැනි සිකුරාදා - 2025.07.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශය ආදිය … | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය … | |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය … | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය … | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය … | — |
| වෙනත් පත්කිරීම් ආදිය … … … … … … | 656 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය … … … … … | — |
| රජයේ නිවේදන … … … … | 657 |
| මිල පාලන දැන්වීම් … … … … | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් … … … … | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන … … … … | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා … … … … | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් … … … … | 665 |
| නැවියන්ට දැන්වීම් … … … … | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් … … … … | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළ කිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 අගෝස්තු මස 07 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 ජූලි මස 25 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ.බ.*).

2025 ජුනි මස 09 වැනි දින ,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

655 - B 82701 - 353 (2025/07)
E - 01

# වෙනත් පත්කිරීම් ආදිය

2025 අංක 462

**ශ්‍රී ලංකා නිත්‍ය නාවික බලකාය**

නිලධාරීන්ගේ උසස් කිරීම්

*2025 මාර්තු මස 11 වැනි දින සිට වැඩ බලන ලුතිනන් වශයෙන්*:

උප ලුතිනන් රත්නායක මුදියන්සේලාගේ නවිඳු තිවංක රත්නායක, එන්ආර්එක්ස් 4550, ශ්‍රීලංනාහ;

උප ලුතිනන් මහ ගමගේ ගයාන් දේමින්ද, එන්ආර්එක්ස් 4551, ශ්‍රීලංනාහ;

උප ලුතිනන් බමුණුසිංහ විතාරණගේ ප්‍රමෝද් පියුමන්ත, එන්ආර්එක්ස් 4553, ශ්‍රීලංනාහ;

උප ලුතිනන් දසනායක මුදියන්සේලාගේ පසිඳු ශෙෂාන් දසනායක, එන්ආර්එක්ස් 4554, ශ්‍රීලංනාහ;

උප ලුතිනන් සමරප්පුලිගේ චමිඳු හර්ෂන විදුරංග ප්‍රනාන්දු, එන්ආර්එක්ස් 4555, ශ්‍රීලංනාහ;

උප ලුතිනන් වගපේඩි ගෙදර ජාලිය ගංගනාත්, එන්ආර්එක්ස් 4556, ශ්‍රීලංනාහ;

උප ලුතිනන් හෙට්ටිආරච්චිගේ නදුන් අචින්ත හෙට්ටිආරච්චි, එන්ආර්එක්ස් 4557, ශ්‍රීලංනාහ;

උප ලුතිනන් වීරකෝන් මුදියන්සේලාගේ පසිඳු ඩිල්මිණ, එන්ආර්එක්ස් 4558, ශ්‍රීලංනාහ;

උප ලුතිනන් කිරිල දෙනියගේ දිලීප ප්‍රසාද්, එන්ආර්එක්ස් 4559, ශ්‍රීලංනාහ;

උප ලුතිනන් රජවාසල අතපත්තු මුදියන්සේලාගේ ප්‍රමෝද් මිහිරංග මොලගොඩ, එන්ආර්එක්ස් 4560, ශ්‍රීලංනාහ;

උප ලුතිනන් බංගමුවගේ ගනේෂ් කෝකිල, එන්ආර්එක්ස් 4561, ශ්‍රීලංනාහ;

උප ලුතිනන් ලෝකුරුගේ තිළිණ නිර්මාණ ආරියරත්න, එන්ආර්එක්ස් 4562, ශ්‍රීලංනාහ;

උප ලුතිනන් ගරුසිංහගේ භාෂණ පියුමාල් කරුණාරත්න, එන්ආර්එක්ස් 4563, ශ්‍රීලංනාහ;

උප ලුතිනන් අතුකෝරළ දෙන් සංදීප මදුමාල්, එන්ආර්එක්ස් 4564, ශ්‍රීලංනාහ.

*2025 මාර්තු මස 11 වැනි දින සිට වැඩ බලන ලුතිනන් (සැ) වශයෙන්*:

උප ලුතිනන් (සැ) පිනිඳු අනුපිය සමරසිංහ, එන්ආර්එස් 4588, ශ්‍රීලංනාහ;

උප ලුතිනන් (සැ) හේවාකට්ටාඩිගේ මනුජ කවීන් අංජන, එන්ආර්එස් 4589, ශ්‍රීලංනාහ;

උප ලුතිනන් (සැ) කහනාවිට ලියනගේ දෙන සරණි ටාන්යා, එන්ආර්එස් 4590, ශ්‍රීලංනාහ;

උප ලුතිනන් (සැ) වැලිගම ගමගේ සත්සරනි තාරුකා, එන්ආර්එස් 4591, ශ්‍රීලංනාහ.

*2025 මාර්තු මස 11 වැනි දින සිට වැඩ බලන ලුතිනන් (විපා) වශයෙන්*:

උප ලුතිනන් (විපා) සුහසිංහ මුදියන්සේලාගේ කෝරලේ ගෙදර රවිඳු බණ්ඩාර ජයරත්න, එන්ආර්ආර් 4594, ශ්‍රීලංනාහ;

උප ලුතිනන් (විපා) දික්වැල්ල විදනගේ නවෝද් දේශිත, එන්ආර්ආර් 4595, ශ්‍රීලංනාහ.

බීඒකේඑස්පී බානගොඩ,
ආර්එස්පී, යූඑස්පී, එන්ඩීසී, පීඑස්සී,
වයිස් අද්මිරාල්,
නාවික හමුදාධිපති.

2025 ජූනි මස 26 වැනි දින,
කොළඹ දී ය.

07-750

---

2025 අංක 463

**ශ්‍රී ලංකා නිත්‍ය නාවික බලකාය**

නිලධාරින්ගේ උසස් කිරීම්

*2024 මැයි මස 01 වැනි දින සිට උප ලුතිනන් වශයෙන්*:

වැඩ බලන උප ලුතිනන් නිමේෂ් ඩිලුක්ෂණ උඩුගමකෝරාල, එන්ආර්එම් 4162, ශ්‍රීලංනාහ;

වැඩ බලන උප ලුතිනන් දෙවින් චින්දුල එදිරිසිංහ, එන්ආර්එම් 4163, ශ්‍රීලංනාහ;

වැඩ බලන උප ලුතිනන් වඩුතන්ත්‍රි ෂෙනෙත් රශ්මික, එන්ආර්එම් 4164, ශ්‍රීලංනාහ;

වැඩ බලන උප ලුතිනන් දසිත් බුවනෙක ජයතිලක, එන්ආර්එම් 4165, ශ්‍රීලංනාහ;

වැඩ බලන උප ලුතිනන් කංකානම් ගමගේ දක්ෂිණ භාරත සංඛ, එන්ආර්එම් 4169, ශ්‍රීලංනාහ;

වැඩ බලන උප ලුතිනන් මොහියදීන් ෆවාහිර් ඉන්ජාස් නජීද්, එන්ආර්එම් 4171, ශ්‍රීලංනාහ;

වැඩ බලන උප ලුතිනන් රණදීරගේ ජයාන් චතුරංග, එන්ආර්එම් 4172, ශ්‍රීලංනාහ;

වැඩ බලන උප ලුතිනන් උඩුමලගල ගමගේ නවෝද් සංජන, එන්ආර්එම් 4173, ශ්‍රීලංනාහ;

වැඩ බලන උප ලුතිනන් දළුවත්තගේ දොන් දේශාන් ලක්ෂිත සපරමාදු, එන්ආර්එම් 4177, ශ්‍රීලංනාහ;

වැඩ බලන උප ලුතිනන් රණතුංග ආරච්චිගේ පසිඳු රංගන පෙරේරා, එන්ආර්එම් 4179, ශ්‍රීලංනාහ;
වැඩ බලන උප ලුතිනන් මැදගෙදර නිපුන ඉසුරංග විජේබණ්ඩාර, එන්ආර්එම් 4181, ශ්‍රීලංනාහ.

*2024 සැප්තැම්බර් මස 01 වැනි දින සිට උප ලුතිනන් වශයෙන්*:

වැඩ බලන උප ලුතිනන් ලකිත් කවිෂ ද අල්විස් සමරසිංහ, එන්ආර්එම් 4168, ශ්‍රීලංනාහ;
වැඩ බලන උප ලුතිනන් සන්තුෂ ස්වර්ණ මීමැඩුම, එන්ආර්එම් 4175, ශ්‍රීලංනාහ;
වැඩ බලන උප ලුතිනන් වීරසූරිය කංකානමලාගේ දූලන්ජන් චාමර වීරසූරිය, එන්ආර්එම් 4176, ශ්‍රීලංනාහ;
වැඩ බලන උප ලුතිනන් මොහොමඩ් සහීල් අහමඩ් මින්හාජ්, එන්ආර්එම් 4178, ශ්‍රීලංනාහ;
වැඩ බලන උප ලුතිනන් පැතුම් විමුක්ති විජේසේකර, එන්ආර්එම් 4182, ශ්‍රීලංනාහ.

බීජ්කේඑස්පී බානගොඩ,
ආර්එස්පී, යූඑස්පී, එන්ඩීසී, පීඑස්සී,
වයිස් අද්මිරාල්,
නාවික හමුදාධිපති.

2025 ජූලි මස 04 වැනි දින,
කොළඹ දී ය.

07-745

## රජයේ නිවේදන

### ඓතිහාසික විල්බාව ශ්‍රී පත්තිනි මහා දේවාලයේ වාර්ෂික ඇසළ පෙරහැර මංගල්‍යය - 2025

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය කුරුණෑගල

වන්දනා ගමන් ආඥාපනත

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඓතිහාසික විල්බාව ශ්‍රී පත්තිනි මහා දේවාලයේ වාර්ෂික ඇසළ පෙරහැර මංගල්‍යය 2025 අගෝස්තු මස 11 වැනි දින පැවැත්වෙන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළ කෙරෙන රෙගුලාසිවල දෙවැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩබ්ලිව්. එස්. සේනාතිස්ස,
ප්‍රාදේශීය ලේකම්,
කුරුණෑගල.

2025 ජූලි මස 07 වැනි දින,
කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07-739

---

### ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ඉඹුල්පෙ

බොල්තුඹේ සමන් දේවාලයේ වාර්ෂික ඇසළ මහ පෙරහැර - 2025

**පෙරහැර පවත්වන කාල සීමාව :**

1. 2025 වසරේ ඇසළ පෙරහැර සඳහා කප් සිටුවීම 2025.06.26 දින සුභ මොහොතින් සිදු කරන ලදී:

- 2025.07.30 වැනි දින සර්ව රාත්‍රික පිරිත් දේශනය ද ;
- 2025.07.30 වැනි දින සිට 2025.08.08 වැනි දින දක්වා උඩමළුවේ පෙරහැර ද ;
- 2025.08.09 වැනි දින සිට 2025.08.13 වැනි දින දක්වා රන්දෝලි මහ පෙරහැර ද ;
- 2025.08.14 වැනි දින වලහුං ඇල්ල මූකලාන දිය බුබුලේ දී දිය කැපීමේ මංගල්‍යයෙන් අනතුරුව පෙරහැර ගෙවදීමෙන් ඇසළ පෙරහැර මංගල්‍යය නිමා කිරීමට නියමිතය.

**කඳවුරු ප්‍රදේශ යනු :**

2. දේවාලයේ උතුරට : පාර, එම්. කේ. ලුවිස් සිංඤෝ, එම්. කේ. පොඩිමහත්තයා යන අයගේ ඉඩම ද, නැගෙනහිරට : සිරි නිමල් හා එම්. කේ. විජේදාස යන අයගේ ඉඩම් ද, දකුණට : රං බණ්ඩාර මහතාගේ ගල්පඩිවත්ත යන ඉඩම ද, බස්නාහිරට: බී. එම්. විජේහාමි හා නෝබට් චින්තාමණී යන අයගේ ඉඩම් ද මායිම්ව පිහිටි භූමි භාගය පෙරහැර පවත්වන කඳවුරු ප්‍රදේශය වේ.

**ආහාර හා ජලය :**

3. විහාර මළුව, බෝධි මළුව හා දේවාල භූමිය යන ස්ථාන අවට භූමි භාගවල ආහාර පිසීම තහනම් කරමි.

**වෙළෙඳාම :**

4. උඩ මළුව තුළ, දඩු හැල තුළ, චෛත්‍ය මළුව තුළ, රථයේ මළුව හා විහාර මළුව තුළ සියලු වෙළෙඳාම් තහනම් කරමි.

5. පහළ වීදියේ දකුණු පැත්තට ප්‍රධාන ගල්පඩි පෙළ සිට සිංහාසන මන්දිරය දක්වා ගල්පඩි පෙළ නැගෙනහිර පැත්තෙන් නැටුම් කාමරය දක්වා පහළ වීදියේ දේවාලය දෙසට වන්නට රථගේ මළුව බැම්ම සිට චෛත්‍යය කොටස දක්වා ද මා විසින් නියම කරන ලද භූමිය ද නැවත රථගෙයි මළුවට නැගෙනහිරින් හා දකුණින් පහළ කොටස ද රථගෙයි ඉදිරිපසින් දේවාලයට නැගෙනහිර සීමාවට ආසන්නව ද සියලු ආකාරයේ සාමාන්‍යයෙන් පවත්වාගෙන යනු ලබන, ම විසින් ලියාපදිංචි කර ඇති ස්ථිර වෙළෙඳසැල්වල හැර අනෙකුත් වෙළෙඳාම් කටයුතු සිදු කිරීම තහනම් ය.

6. ප්‍රාදේශීය ලේකම්වරයාගේ බලයලත් නිලධාරියකුගේ අනුමැතියක් නොමැතිව කිසියම් තැනැත්තකු විසින් කඳවුරු ප්‍රදේශය තුළ ටිකට්පත්, කොඩි විකිණීම හෝ වෙනත් අන්දමක කුමන කාර්යයක් සඳහා හෝ මුදල් එකතු කිරීම නොකළ යුතු අතර, පෙරහැර පවත්වන කාල සීමාව තුළ එම භූමියේ සහ ඒ අවට දේවාල සීමාව තුළ දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන හා සියලුම මත් ද්‍රව්‍ය විකිණීම හා භාවිතා කිරීම සම්පූර්ණයෙන් ම තහනම් කරමි.

**වාහන:**

7. ප්‍රධාන මාර්ගයේ පුද්ගලික වාහන නතර කිරීම සම්පූර්ණයෙන් ම තහනම් කරමි. බයිසිකල් හා කරත්ත ඇතුළුව සියලුම රථ වාහන මාර්ග හෝ කඳවුරු භාර නිලධාරි තැනගේ බලපතක් නොමැතිව කඳවුරු භූමිය තුළට ඇතුළු කිරීම තහනම් ය.

**සෞඛ්‍ය :**

8. යම් ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් පෙළෙන කිසියම් තැනැත්තෙක් කඳවුරු පෙදෙස තුළට ඇතුළත් නොවිය යුතු අතර, රට තුළ පවතින වර්තමාන සෞඛ්‍ය උපදෙස්වලට අනුකූලව ක්‍රියා කිරීමට තරයේ වග බලාගත යුතු ය.

9. බද්දට ගන්නා ලද වෙළෙඳ බිම්වල ඉදි කරන තාවකාලික ගොඩනැගිලි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ උපදෙස්වලට අනුකූල විය යුතු ය. බිම් කොටස් බදු ගන්නා වෙළෙන්දන් විසින් ඇසළ පෙරහැර මංගල්‍යයෙන් පසු කඳවුරු භූමිය තුළ පොලිතීන් ඇතුළු සියලු අපද්‍රව්‍ය එකතු කර මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ උපදෙස් පරිදි ඉවත් කළ යුතු ය.

**ගොඩනැගිලි ඉදි කිරීම :**

10. මාගෙන් ලබා ගත් අවසරයක් නොමැතිව කඳවුරු ප්‍රදේශයේ කිසිදු ගොඩනැගිල්ලක් ඉදි කිරීම හා අනවසර වෙළෙඳම් කටයුතු තහනම්වන අතර, සෞඛ්‍ය අංශවල නිර්දේශවලට අනුව පොලීසිය විසින් ඉවත් කරනු ලැබේ.

**යාචකයෝ :**

11. පූජා භූමිය තුළ හෝ කඳවුරු පෙදෙස තුළ මුදලින් හෝ යම් වෙනත් ආකාරයකින් හෝ කිසිම තැනැත්තකු විසින් සිඟමන් යැදීම හෝ පිනට යමක් ඉල්ලා ගැනීම හෝ පිනට යමක් දීම හෝ පිනට යමක් බෙදා හැරීමට හෝ අවසර නොමැත.

ඩී. පී. ජී. රේණුකා,
ප්‍රාදේශීය ලේකම්,
ඉඹුල්පෙ.

07 - 751

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/13/2025/පිටු/සැ.

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවැනි තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස්කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ **2025.07.18** වැනි දින සිට **2025.08.01** වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂාකර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශකර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිළිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2025.08.08 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

**ඩබ්. ආර්. ඒ. එන්. එස්. විජයසිංහ,**
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

| *ලියාපදිංචි පොත්වල කැඩීබිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ, එම් කොට්ඨාසයේ 733 වෙළුමේ, 206 පත්ඉරුව. | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරළේ, නුගේගොඩ පිහිටි "දෙල්ගහවත්ත" නැමැති ඉඩමේ අංක 2527 A - 1962.12.05 දිනැති සිතියමේ ලොට් 1 සඳහා මායිම්,<br><br>*උතුර* : ලොට් 2;<br><br>*නැගෙනහිර* : මෙම ඉඩමේ කොටසක්;<br><br>*දකුණ* : එම්. එෆ්. ගුණසේකරගේ ඉඩම;<br><br>*බස්නාහිර* : පාර.<br><br>*බිම් ප්‍රමාණය* : පර්. 15. | 01. එම්. එම්. එම්. ඒ. රහීම් ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1963.02.05 දින ලියා සහතික කරන ලද අංක 3509 දරන විකුණුම් ඔප්පුව.<br><br>02. යූ. පොන්නම්පෙරුම ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1983.10.11 දින ලියා සහතික කරන ලද අංක 63 දරන විකුණුම් ඔප්පුව.<br><br>03. යූ. පොන්නම්පෙරුම ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1986.02.20 දින ලියා සහතික කරන ලද අංක 185 දරන උකස් ඔප්පුව. |

07-694

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/39/2025/පිටු/සැ.

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවැනි තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස්කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ **2025.07.18** වැනි දින සිට **2025.08.01** වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂාකර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශකර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2025.08.08 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

**ඩබ්. ආර්. ඒ. එන්. එස්. විජයසිංහ,**
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

| *ලියාපදිංචි පොත්වල කැඩීබිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ, එම් කොට්ඨාසයේ 2236 වෙළුමේ, 286 පත්ඉරුව. | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරළේ, කරගම්පිටිය - යූනියන් පෙදෙසෙ හි පිහිටි වරිපනම් අංක 18/3 දරන "කෝන්ගහවත්ත, ලින්ද කැලේ" නැමැති ඉඩමට මානක කේ. ඩී. ජී. වීරසිංහගේ අංක 953 සහ 1996.01.02 දිනැති මැනුමේ ලොට් 2 සඳහා මායිම්,<br><br>*උතුර* : ජයන්ත ද සිල්වාට අයිති ඉඩම;<br><br>*නැගෙනහිර* : ලොට් 3;<br><br>*දකුණ* : පාර;<br><br>*බස්නාහිර* : ලොට් 1.<br><br>*බිම් ප්‍රමාණය* : පර්චස්. 6.52 | 01. බී. බී. රණසිංහ ප්‍රසිද්ධ නොතාරිස් විසින් 2008.09.26 දින ලියා සහතික කරන ලද අංක 5828 දරන විකුණුම් ඔප්පුව.<br><br>02. බී. බී. රණසිංහ ප්‍රසිද්ධ නොතාරිස් විසින් 2008.09.26 දින ලියා සහතික කරන ලද අංක 5829 දරන උකස් ඔප්පුව. |

07-695

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/45/2023/පිටු/සැ.

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවැනි තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස්කර ඇති බැවි ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ **2025.07.18** වැනි දින සිට **2025.08.01** වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂාකර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශකර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිළිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2025.08.08 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු ය.

**ඩබ්. ආර්. ඒ. එන්. එස්. විජයසිංහ,**
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

| *ලියාපදිංචි පොත්වල කැඩීබිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ, දෙහිවල කොට්ඨාසයේ 60 වෙළුමේ, 33, 34 පත්‍රිරු. | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ දෙහිවල - ගල්කිස්ස නගර සභා සීමාවේ, දෙහිවල කැම්බල් පෙදෙස පිහිටි "අළුත්වත්ත" නැමැති ඉඩමට සර්වේ ජනරාල්ගේ අංක ppකො 4786 සහ 1977.08.10 දිනැති පිඹුරේ කැබලි අංක 642 සඳහා මායිම්,<br>*උතුර* : 4ඒ හා 4බී ව.අ.41 ඇල්බට් පෙදෙස සහ 5 වරිපනම් අංක 37 ඇල්බට් පෙදෙස;<br>*නැගෙනහිර* : 643;<br>*දකුණ* : කැම්බල් පෙදෙස;<br>*බස්නාහිර* : 641.<br>*බිම් ප්‍රමාණය* : පර්චස් 19. | 01. ජාතික නිවාස කොමසාරිස් විසින් 1993.07.17 දින ලියා සහතික කරන ලද අංක 8598 දරන විකුණුම් ඔප්පුව. |

07-696

**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය**

තැපැල් හා විදුලි පණිවුඩ සුභ සාධක සංගමය

(286 වැනි අධිකාරය වූ ) තැපැල් හා විදුලි පණිවුඩ සුභ සාධක සංගම් ආඥාපනතේ 11 වැනි වගන්තිය යටතේ තැපැල් හා විදුලි පණිවුඩ සුභ සාධක සංගමය විසින් සම්පාදිත හා එම වගන්තිය මගින් සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ඔහු විසින් ස්ථිර කරන ලද රීතිය.

ලේකම්,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

2025 ජුනි මස 28 වැනි දින,
කොළඹ දී ය.

**රීති**

1949 ජනවාරි මස 07 වැනි දින අංක 9936 දරන *ගැසට් පත්‍රයේ* පළකරනු ලැබ, කලින් කළ සංශෝධනය කරනු ලැබූ තැපැල් හා විදුලි පණිවුඩ සුභ සාධක සංගමයේ රීති පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**(1) I වන පරිච්ඡේදය - සාමාන්‍ය රීති**

7 (1) අ රීතිය - **අවුරුදු 35** යන්න ඉවත්කර **අවුරුදු 45** ආදේශ කරන්න.

7 (1) ඇ රීතිය - 7 (1) ආ රීතියට පසුව පහත රීතිය ඇතුළත් කරන්න.

**වයස අවුරුදු 40 ට වැඩි අයෙක් සංගමයේ සාමාජිකත්වය ලබා ගන්නේ නම් ඔහු/ඇය විසින් වයස අවුරුදු 40 සිට සාමාජික හා සාමාජික යැපෙන්නන්ගේ අවමංගල්‍යාධාර දීමනා යෝජනා ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.**

9 (1) රීතිය - ඉලක්කමින් දක්වා ඇති **රුපියල් 100/-** යන්න ඉවත්කර **රුපියල් 300/-** යන්න ආදේශ කරන්න.

10 (vi) රීතිය - පහත පරිදි සංශෝධනය කරන්න.

**නියමිත පරිදි සාමාජික ගාස්තු ගෙවා ඇති පරිණමිත සාමාජිකයෙකුට වර්ෂයකට වරක් රුපියල් පන්දහසක උත්සව අත්තිකාරම් මුදලක් ලබා දිය හැකිය. එය සමාන වාරික දහයකින් ආපසු ගෙවිය යුතු අතර වාරිකයෙන් 10% ක කාර්යය ගාස්තුවක් අය කෙරේ. ලබා ගන්නා අත්තිකාරම් මුදල ආපසු ගෙවනු නොලැබුවහොත් 10 (iv) රීතිය යටතේ කරනු ලබන ප්‍රදානයෙන් මෙම මුදල අය කරගත යුතුය. එවැනි සාමාජිකයෙකුට ඔහු සාමාජිකත්වය දරන කාල සීමාව තුළ නැවත; කිසිම උත්සව අත්තිකාරම් මුදලක් ලබා නොදිය යුතුය.**

11 (ආ) රීතිය - පහත පරිදි සංශෝධනය කරන්න.

**සාමාජිකයෙකුගේ මරණයක් සිදුවූ විට සංස්ථාවේ අරමුදලින් රුපියල් 30,000/- ක මුදලක් අවමංගල්‍යය ප්‍රදානයක් ලෙස ගෙවිය යුතුය. මියගිය සාමාජිකයාගෙන් සංස්ථාවට අයවිය යුතු මුදලක් වේ නම් එසේ ගෙවන ප්‍රදානයෙන් අඩුකර ගත යුතුය. සාමාජික යැපෙන්නන්ගේ අවමංගල්‍යාධාර දීමනා යෝජනා ක්‍රමයට මාසික දායක මුදල රුපියල් 50/- වන අතර, එයින් රුපියල් 20/- ක් සාමාජික අවමංගල්‍යය ප්‍රදාන වෙනුවෙන් ද, රුපියල් 30/-ක් සාමාජිකයන්ගේ යැපෙන්නන්ගේ අවමංගල්‍ය ප්‍රදානය වෙනුවෙන් ද බැර කළ යුතුය.**

19 (2) රීතිය - ඉලක්කමින් ඇති **රුපියල් 9,000,000/-** යන්න ඉවත්කර **රුපියල් 30,000,000/-** යන්න ආදේශ කරන්න.

19 (3) (i) රීතිය - (අ), (ආ), (ඇ) වගන්ති ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් වගන්ති ආදේශ කරන්න.

**(*අ*) අවුරුදු එකකට වැඩි සහ අවුරුදු පහක් දක්වා කාලයක් සංස්ථාවේ සාමාජිකයකු වී සිටින තැනැත්තෙකුට රුපියල් 25,000/- ක් ගෙවිය යුතුය.**

**(*ආ*) අවුරුදු පහකට වැඩි සහ අවුරුදු දහයක් දක්වා කාලයක් සංස්ථාවේ සාමාජිකයකු වී සිටින තැනැත්තෙකුට රුපියල් 50,000/- ක් ගෙවිය යුතුය.**

**(*ඇ*) අවුරුදු දහයකට වැඩි කාලයක් සංස්ථාවේ සාමාජිකයකු වී සිටින තැනැත්තෙකුට රුපියල් 75,000/- ක් ගෙවිය යුතුය.**

**(2) III වන පරිච්ඡේදය - විශ්‍රාම යහසාධක ක්‍රමය**

2 රීතිය - පහත පරිදි සංශෝධනය කරන්න.

**සංස්ථාවේ සෑම සාමාජිකයෙකුම විශ්‍රාම යහසාධක ක්‍රමය සඳහා අවම වශයෙන් මසකට රුපියල් 200/- ගෙවිය යුතුය. තමා කැමති නම් ඊට වැඩි මුදලක් ගෙවීමට අවකාශ ඇති අතර, එසේ වැඩි කරන මුදල රුපියල් 100/- ගුණිතයන්ගෙන් විය යුතුය.**

**(3) IV වන පරිච්ඡේදය - පාරිතෝෂික ක්‍රමය**

2 රීතිය - පහත පරිදි සංශෝධනය කරන්න.

**විශ්‍රාම යන, අස් වී යන, සේවයෙන් පහවන සියළුම සාමාජිකයන් හට තමන් සංගමයේ සාමාජිකත්වය දැරූ වසර ගණන අනුව පහත සඳහන් පරිදි විශ්‍රාම පාරිතෝෂිකයක් ලැබිය යුතුය.**

i. **සාමාජික කාලය වසර 10 දක්වා වසරකට රුපියල් 100/- ක් බැගින්**
ii. **සාමාජික කාලය වසර 15 දක්වා වසරකට රුපියල් 200/- ක් බැගින්**
iii. **සාමාජික කාලය වසර 20 දක්වා වසරකට රුපියල් 300/- ක් බැගින්**
iv. **සාමාජික කාලය වසර 20 කට වැඩි නම් වසරකට රුපියල් 400/-ක් බැගින්**

**(4) V වන පරිච්ඡේදය - විවාහ මංගල්‍යය ණය**

1 රීතිය - 1 වන ඡේදයේ රුපියල් **100,000/-** යන්න ඉවත් කර රුපියල් **150,000/-** යන්න ආදේශ කරන්න.

2 වන ඡේදයේ රුපියල් **2,750/-** යන්න ඉවත් කර රුපියල් **3,750/-** යන්නත් රුපියල් **250/-** යන්න ඉවත් කර රුපියල් **375/-** යන්න ආදේශ කරන්න.

3 වන ඡේදයේ රුපියල් **125/-** යන්න ඉවත් කර රුපියල් **187.50** යන්න ආදේශ කරන්න.

2 රීතිය - පහත පරිදි සංශෝධනය කරන්න.
**ණය ඉල්ලුම් කරන සාමාජිකයා මාස 06 ක සාමාජිකත්වය සම්පූර්ණ කළ අයෙකු විය යුතුය.**

**(5) VI වන පරිච්ඡේදය - සාමාජිකයන්ගේ යැපෙන්නන් සඳහා අවමංගල්‍යාධාර දීමනා යෝජනා ක්‍රමය**

iv රීතිය - (*අ*.) රුපියල් **10,000/-** යන්න ඉවත් කර රුපියල් **20,000/-** යන්න ආදේශ කරන්න.

(*ආ*.) රුපියල් **5,000/-** යන්න ඉවත් කර රුපියල් **10,000/-** යන්න ආදේශ කරන්න.

**(ඇ.) සාමාජිකයාගේ මව, පියා, කලත්‍රයාගේ මව, පියා යන අයගේ අභාවයකදී දෙදෙනෙකුට පමණක් රුපියල් 5,000/-** යනුවෙන් සංශෝධනය කරන්න.

**(6) VII** වන පරිච්ඡේදය **- විශේෂ භාණ්ඩ / අයිතමයන් මිලදී ගැනීම සඳහා ණය**

1 රීතිය - **රුපියල් ලක්ෂ දෙකක් (රු.200,000/-)** යන්න ඉවත් කර **රුපියල් ලක්ෂ තුනක් (රු. 300,000/-)** යන්න ආදේශ කරන්න.

3 රීතිය - ඉලක්කමින් ඇති රු. **200,000/-** යන්න ඉවත් කර රු. **300,000/-** යන්න ආදේශ කරන්න.

4 රීතිය - ඇ වගන්තිය
**ඉල්ලුම්කරු අවම වශයෙන් වසර 03 ක සාමාජිකත්වය සම්පූර්ණ කර තිබිය යුතුය** යන්න වෙනුවට **ඉල්ලුම්කරු අවම වශයෙන් වසර 02 ක සාමාජිකත්වය සම්පූර්ණ කර තිබිය යුතුය** යන්න ආදේශ කරන්න.

5 රීතිය - ඉලක්කමින් ඇති රුපියල් **8,000,000/-** යන්න ඉවත් කර රුපියල් **60,000,000/-** යන්න ආදේශ කරන්න.

**(7) VIII** වන පරිච්ඡේදය **- උත්සව අත්තිකාරම් ණය**

1 රීතිය - ඉලක්කමින් ඇති රුපියල් **60,000/-** යන්න ඉවත් කර රුපියල් **75,000/-** යන්න ආදේශ කරන්න.

4 රීතිය - **අවුරුදු දෙකකට නොඅඩු සාමාජිකත්වයක්** යන්න ඉවත් කර **අවුරුදු එකකට නොඅඩු සාමාජිකත්වයක්** යන්න ආදේශ කරන්න.

**(8) XI** වන පරිච්ඡේදය **- සුභසාධක අරමුදල**

1 (ඇ) රීතිය - මසකට **රුපියල් 10 ක මුදලක්** යන්න ඉවත් කර මසකට **රුපියල් 20/- ක** මුදලක් යන්න ආදේශ කරන්න.

2 රීතිය - **5 වසර ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය**
2 (අ) රීතිය - **ශිෂ්‍යයන් විසි දෙනෙකුට** යන්න ඉවත් කර **ශිෂ්‍යයින් තිස් දෙනෙකුට** යන්න ආදේශ කරන්න.

3 රීතිය - **අ.පො.ස. උසස් පෙළ ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය**

3 (අ) රීතිය - **10** දෙනෙකුට **ශිෂ්‍යත්ව 10 ක්** යන්න ඉවත් කර **15** දෙනෙකුට **ශිෂ්‍යත්ව 15ක්** යන්න ආදේශ කරන්න.

**වෛද්‍ය නලින්ද ජයතිස්ස (පා.ම.),**
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍ය.

2025 ජුනි මස 28 වැනි දින දී ය.

07 - 719

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී - බද්දේගම ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 04 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංකය පී.කිව්. 116) අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංකය : 2875662
පතිරගේ බාත්වෙයා

2024 පෙබරවාරි 21 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය ඒකච්ඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

ඇල්පිටිය ප්‍රසිද්ධ නොතාරිස් එන්. හල්පන්දෙනිය විසින් 2019 මාර්තු 15 වැනි දින සහතික කරන ලද අංක 2610 සහ 2019 ජූලි 08 වැනි දින සහතික කරන ලද අංක 2687 දරන උකස් බැඳුම්කරයන් මගින් මෙහි පහත පළමුවන උපලේඛනයේ (සහ/හෝ මින් මතු සඳහන් කරන උකස් බැඳුම්කරවල උපලේඛනයේ) සවිස්තරව විස්තර කරන ලද ඉඩම හා පරිශ්‍රය උකස් කොට බැඳ දමා ඇති බද්දේගම, සන්දරවල, වඳුරඹ පාරේ, අංක 184 දරන ස්ථානයේ "පතිරගේ බාත්වෙයා" යන නාමය, විලාසය සහ ආයතනය යටතේ හවුල් ව්‍යාපාරයක් ලෙස ව්‍යාපාරය පවත්වාගෙන යන දෙදෙනාම බද්දේගම, සන්දරවල, වඳුරඹ පාරේ, අංක 184 දරන ස්ථානයේ දූවේ පතිරගේ කිත්සිරි කුමාර සහ හඳපාන්ගොඩ මුදලිගේ දෝන නිරෝෂා දිල්රුක්ෂි හඳපාන්ගොඩ ණයකරුවන් හැටියට සහ ඉහත කී පහසුකම නැවත ගෙවීම සඳහා ඇපයක් වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. නමට ලියන ලද්දා වූ ද එකී බැඳුම්කර අංක 2610 සහ 2687 මත අයවිය යුතු මුදල් ගෙවීම එකී දූවේ පතිරගේ කිත්සිරි කුමාර සහ හඳපාන්ගොඩ මුදලිගේ දෝන නිරෝෂා දිල්රුක්ෂි හඳපාන්ගොඩ පැහැර හැර ඇති හෙයින්,

ඇල්පිටිය ප්‍රසිද්ධ නොතාරිස් එන්. හල්පන්දෙනිය විසින් 2020 සැප්තැම්බර් 24 වැනි දින සහතික කරන ලද අංක 2971 දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත දෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද ඉඩම හා පරිශ්‍රය උකස් කොට බැඳ දමා ඇති එකී "පතිරගේ බාත්වෙයා" හි දූවේ පතිරගේ කිත්සිරි කුමාර සහ හඳපාන්ගොඩ මුදලිගේ දෝන නිරෝෂා දිල්රුක්ෂි හඳපාන්ගොඩ ණයකරුවන් හැටියට සහ ඉහත කී පහසුකම නැවත ගෙවීම සඳහා ඇපයක් වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. නමට ලියන ලද්දා වූ ද එකී උකස් බැඳුම්කර අංක 2971 මත අයවිය යුතු මුදල් ගෙවීම එකී දූවේ පතිරගේ කිත්සිරි කුමාර සහ හඳපාන්ගොඩ මුදලිගේ දෝන නිරෝෂා දිල්රුක්ෂි හඳපාන්ගොඩ පැහැර හැර ඇති හෙයින්,

සහ ප්‍රතිව්‍යුහගත ණය අංක 2875662 සම්බන්ධයෙන් එකී උකස් බැඳුම්කරයන් යටතේ, වෙනත් කරුණු අතර, රුපියල් මිලියන අනූ දෙකයි හාර ලක්ෂ අසූ හත් දහස් දෙසිය විස්සයි ශත තිස් එකක (රු. 92,487,220.31) මුළු මුදලක් 2024 ජනවාරි 09 දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට දැන් අය විය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන අනූ දෙකයි හාර ලක්ෂ අසූ හත් දහස් දෙසිය විස්සයි ශත තිස් එකක (රු. 92,487,220.31ක) මුදල අයකර ගැනීම සඳහා සහ 2024 ජනවාරි 10 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට ප්‍රතිව්‍යුහගත ණය අංක 2875662 සම්බන්ධයෙන් හිඟව තිබෙන මුල් මුදලේ ප්‍රමාණය මත රු. 77,499,414.46 ක මුදලක් තුළ වර්ෂයකට 11% බැගින් වැඩිදුර පොළිය ද සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුලුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් මුදලක් වේ නම් ඒවා ද අඩු කොට එකී අංක 2610, 2687 සහ 2971 දරන උකස් බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස්කොට ඇත්තාවූ ද මෙහි පහත පළමුවන සහ දෙවන උපලේඛනවල සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද ඉඩම සහ පරිශ්‍රය කොළඹ 08, බොරැල්ල, පෙලෙන්ගස්තුඩුව පාරේ, අංක 109/21 දරන ස්ථානයේ බලයලත් වෙන්දේසිකරු අරච්චාවල සුසිලා කුමාරි යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### පළමුවන උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, දකුණු ගහබොඩ පත්තුවේ, බද්දේගම ප්‍රාදේශීය සභා සීමා ඇතුළත බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සන්දරවල, 220B ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත ගනේගම නැගෙනහිර පිහිටි "හම්මෙලියවගුරු සහ ඔහොබඩලියැද්ද" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. ජී. ඩී. යූ. කරුණාරත්න විසින් 2012 ජනවාරි 21 වැනි දින පිළියෙල කරන ලද අංක 12A/2012 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් A වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : එම ඉඩමේ කොටස සහ ඔහොබඩලියැද්ද හි ලොට් 1B මගින් ද, නැගෙනහිරට : ප්‍රධාන පාර මගින් ද, දකුණට : ලොට් 03 මගින් ද සහ බස්නාහිරට : අගල සහ කටුඅතන ඕවිට මගින් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව රූඩ් දෙකයි පර්චස් දෙකයි දශම හතරයි එකක (රූ.2, පර්. 2.41) විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව N 172/51 යටතේ ලියාපදිංචි කර ඇත.

### දෙවන උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, දකුණු ගහබොඩ පත්තුවේ, බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ බද්දේගම ප්‍රාදේශීය

සහා සීමා ඇතුළත, සන්දරවල, 220B ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත ගනේගම නැගෙනහිර පිහිටි "ඔහොබඩලියැද්ද" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. සී. විජේවික්‍රම විසින් 2020 ජූලි 09 වැනි දින පිළියෙල කරන ලද අංක 4832 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් X වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : එම ඉඩමේ කොටස මගින් ද, නැගෙනහිරට : එම ඉඩමේ කොටස සහ බොබුගහ වගුර මගින් ද, දකුණට : එම ඉඩමේ කොටස මගින් ද සහ බස්නාහිරට : වඳුරඹ සිට බද්දේගම දක්වා ප්‍රධාන පාර මගින් ද මායිම් වූ එකී අංක 4832 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විසි හතරයි දශම පහක (පර්. 24.5) විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

ඉහත ඉඩම පහත දැක්වෙන ඉඩම්වල ඒකාබද්ධ කිරීමක් වේ.

1. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, දකුණු ගහබොඩ පත්තුවේ, බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ බද්දේගම ප්‍රාදේශීය සභා සීමා ඇතුළත සන්දරවල, 220B ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත ගනේගම නැගෙනහිර පිහිටි "ඔහොබඩලියැද්ද" (ඊදනදගහලියැද්ද හි ලොට් 03හි ඔහොබඩලියැද්ද ලොට් 02හි ලොට් 03 සහ 04 හි ඒකාබද්ධකරන ලද සහ උපබෙදුම) නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු, ඩබ්. ජී. ඩී. යූ. කරුණාරත්න විසින් 2000 ජූලි 31 වැනි දින පිළියෙල කරන ලද අංක 5862 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් B වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : එම ඉඩමේ කොටස (ඔහොබඩලියැද්ද කොටස) මගින් ද, නැගෙනහිරට : එම ඉඩමේ කොටස සහ බොබුගහ වගුර *හෙවත්* බෝගහලියැද්ද මගින් ද, දකුණට : ගාල්ල දිස්ත්‍රික් උසාවියේ නඩු අංක P8381 හි ගොනු කරන ලද අංක 1682P දරන පිඹුරේ ලොට් 2 හෙවත් ඊදනගහලියැද්ද හි කොටස මගින් ද සහ බස්නාහිරට : වඳුරඹ සිට සන්දරවල දක්වා ප්‍රධාන පාර මගින් ද මායිම් වූ එකී අංක 5862 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දහ අටයි දශම අට (පර්. 18.8)ක විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/ පත්ඉරුව N 192/115 යටතේ ලියාපදිංචි කර ඇත.

2. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, දකුණු ගහබොඩ පත්තුවේ, බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ බද්දේගම ප්‍රාදේශීය සභා සීමා ඇතුළත සන්දරවල, 220B ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත ගනේගම නැගෙනහිර පිහිටි "ඔහොබඩලියැද්දේ වත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු, එච්. එල්. ආර්. ජයසුන්දර විසින් 2012 පෙබරවාරි 28 වැනි දින පිළියෙල කරන ලද අංක 2795A දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 5A වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : මුල් ඉඩමේ ලොට් 06 මගින් ද, නැගෙනහිරට : ලොට් 5හි ඉතුරු කොටස මගින් ද, දකුණට : මුල් ඉඩමේ ලොට් 3 මගින් ද සහ බස්නාහිරට : ලොට් 3 මගින් ද මායිම් වූ එකී අංක 2795A දරන පිඹුර ප්‍රකාරව පර්චස් එකයි දශම පහක (පර්. 1.5) විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/ පත්ඉරුව N 192/116 යටතේ ලියාපදිංචි කර ඇත.

3. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, දකුණු ගහබොඩ පත්තුවේ, බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ බද්දේගම ප්‍රාදේශීය සභා සීමා ඇතුළත සන්දරවල, 220B ග්‍රාම නිළධාරි කොට්ඨාසය ඇතුළත ගනේගම නැගෙනහිර පිහිටි "ඒකාබද්ධකරන ලද ඔහොබඩලියැද්ද හි ලොට් 2 හි ලොට් 4, ඔහොබඩලියැද්ද හි ලොට් 2හි ලොට් 3, ඔහොබඩලියැද්ද හි ලොට් 2 හි ලොට් 2, ඊදනදගහලියැද්ද හි ලොට් 3 සහ ඔහොබඩලියැද්ද හි කොටස" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. ජී. ඩී. යූ. කරුණාරත්න විසින් 2000 ජූලි 17 වැනි දින පිළියෙළ කරන ලද අංක 5812 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් A හි ඉතුරු කොටස වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට: සිමෙන්ති කයිරුව සහ එම ඉඩමේ කොටස මගින් ද, නැගෙනහිරට : බොබුගහවගුර සහ ඉවුර මගින් ද, දකුණට: එම ඉඩමේ කොටස මගින් ද සහ බස්නාහිරට : වඳුරඹ සිට සන්දරවල දක්වා ප්‍රධාන පාර මගින් ද මායිම් වූ එකී අංක 5812 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විසි තුනක (පර්. 23) ක විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව H 199/70 යටතේ ලියාපදිංචි කර ඇත.

ආර්. ඒ. පී. රාජපක්ෂ,
සමාගම් ලේකම්.

2024 පෙබරවාරි මස 21 වැනි දින.

07-734

---

## නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

### සංශෝධිත 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබූ යෝජනා සම්මතය

2023 දෙසැම්බර් මස 15 වැනි දින පවත්වන ලද නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක දී පහත සඳහන් යෝජනා සම්මතය විශේෂයෙන්ම සහ ඒකමතිකව සම්මත කරන ලදී; එනම්,

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ආයතනය (බැංකුව) වෙනුවෙන් බණ්ඩාරවෙල ප්‍රසිද්ධ නොතාරිස් බී. එම්. බී. රුවන් කුමාර බස්නායක විසින් සහතික කරන ලද 2018.09.28 දින අංක 3219 දරන උකස් බැඳුම්කරය මගින් ද, නුවරඑළිය ප්‍රසිද්ධ නොතාරිස් සේගර් ෂනුෂ්ගර් විසින් සහතික කරන ලද 2019.05.31 දින අංක 32 දරන උකස් බැඳුම්කරය සහ අංක 34 දරන උකස් බැඳුම්කරය මගින් ද, 2019.06.06 දින අංක 37 දරන උකස් බැඳුම්කරය මගින් ද උකස්කර පවරා දෙන ලද මෙහි උපලේඛනයේ සවිස්තරාත්මකව විස්තරකර ඇති දේපළ සහ පරිශ්‍රය ඇපයට තබා එයට එරෙහිව ප්‍රදානය කරන ලද ණයමුදල්/ මූල්‍ය පහසුකම් මත අයවිය යුතු මුදල් ගෙවීම (I වන ණය ගැණුම්කරු වන) ස්වකීය ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය නුවරඑළියේ පිහිටා ඇත්තා වූ ද, 2000.04.06 දින අංක MPS/NE/DS/1/5/1035 දරන සහතිකපත්‍රය යටතේ (මධ්‍යම පළාතේ පළාත් සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ) ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර්වරයා සමඟ ලියාපදිංචි වී ඇත්තා වූ ද, "සේනාරත්න හාඩ්වේයාර්" යන නාමය සහ අභිධානය යටතේ පරම හිමිකාරත්වයක් සහිතව ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යනු ලබන නුවරඑළියේ පදිංචි සපරමාදු මිරිස්ක්කුගේ දොන් කපිල බණ්ඩාර සේනාරත්න යන අය විසින් සහ (II වන ණය ගැණුම්කරු වන) නුවරඑළිය පදිංචි කනකරත්න මුදියන්සේලාගේ පත්ම එරන්දි මංගලිකා යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද;

මෙහි උපලේඛනයේ සවිස්තරාත්මකව විස්තරකර ඇති දේපළෙහි සහ පරිශ්‍රයෙහි බදු ගෙවීමෙන් නිදහස් සින්නක්කර අයිතිකරුවන I වන ණය ගැණුම්කරු විසින් ස්වකීය බදු ගෙවීමෙන් නිදහස් සින්නක්කර අයිතිය, හිමිකම සහ සම්බන්ධතාවය ඉහත කී උකස් බැඳුම්කර යටතේ බැංකුව වෙත උකස්කර ඇති හෙයින් ද;

2023 නොවැම්බර් මස 30 දිනය වනවිට ඉහත කී උකස් බැඳුම්කර මත බැංකුව වෙත රුපියල් මිලියන එකසිය එකොළහයි හත්ලක්ෂ අසූහත් දහස් පන්සිය හැත්තෑ පහයි ශත අනූඑකක් වූ මුදලක් (රු. 111,787,575.91) ලැබිය යුතුව සහ අයවිය යුතුව පවතින හෙයින් ද;

අනතුරුව කිසියම් ගෙවීමක් (සිදුකර ඇත්නම්) එම ගෙවීම අඩු කිරීමෙන් පසුව ප්‍රධාන පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව දරන ලද ප්‍රචාරක පිරිවැය, විකුණුම් පිරිවැය සහ වෙනත් යම් ගාස්තු ද සමඟ ඉහත කී රුපියල් මිලියන එකසිය එකොළහයි හත්ලක්ෂ අසූහත් දහස් පන්සිය හැත්තෑ පහයි ශත අනූඑකක් වූ මුදලක් (රු. 111,787,575.91) හෝ දේපළ වෙන්දේසි දිනය වන විට නොගෙවා ඉතිරිව පවතින එහි යම් කොටසක් සහ 2023 දෙසැම්බර් මස 01 වැනි දින සිට වෙන්දේසි දිනය තෙක් -

(i) වර්ෂයකට සියයට දහඅටයි දශම හතයි පහක් වූ (18.75%) අනුපාතිකය යටතේ ඉහත කී අංක 34 දරන උකස් බැඳුම්කරය සම්බන්ධයෙන් වන විට එම උකස් බැඳුම්කරය මත අයවිය යුතු එම උකස් බැඳුම්කරය මගින් ඇපයෙන් සුරක්ෂිත කරන ලද රුපියල් මිලියන පහයි නවලක්ෂ අනූනවදහස් තුන්සිය පනස් හතයි ශත විසි දෙකක් වූ (රු. 5,999,357.22) මුදල මත පොළිය ද;

(ii) වර්ෂයකට සියයට දහඅටයි දශම හතයි පහක් වූ (18.75%) අනුපාතිකය යටතේ ඉහත කී අංක 3219 සහ 32 දරන උකස් බැඳුම්කර සම්බන්ධයෙන් වන විට එම උකස් බැඳුම්කර මත අයවිය යුතු එම උකස් බැඳුම්කර මගින් ඇපයෙන් සුරක්ෂිත කරන ලද රුපියල් මිලියන තිස් පහක් වූ (රු. 35,000,000.00) මුදල මත පොළිය ද;

(iii) වර්ෂයකට සියයට දහඅටයි දශම හතයි පහක් වූ (18.75%) අනුපාතිකය යටතේ ඉහත කී අංක 3219 සහ 32 දරන උකස් බැඳුම්කර සම්බන්ධයෙන් වනවිට එම උකස් බැඳුම්කර මගින් ඇපයෙන් සුරක්ෂිත කරන ලද රුපියල් මිලියන නවයක් වූ (රු. 9,000,000.00) මුදල මත පොළිය ද;

(iv) වර්ෂයකට සියයට තිස් දෙකක් වූ (32%) අනුපාතිකය යටතේ ඉහත කී අංක 37 දරන උකස් බැඳුම්කරය සම්බන්ධයෙන් වන විට එම උකස් බැඳුම්කරය මගින් ඇපයෙන් සුරක්ෂිත කරන ලද රුපියල් මිලියන පහයි පන්ලක්ෂ හැටනවදහස් හාරසිය පනස් හතයි ශත පනස් එකක් වූ (රු. 5,569,457.51) මුදල මත පොළිය ද;

යනාදී වශයෙන් රුපියල් මිලියන පනස් පහයි පන්ලක්ෂ හැටඅට දහස් අටසිය දාහතරයි ශත හැත්තෑ තුනක් වූ (රු. 55,568,814.73) සමස්ථ මුදලක් මත පොළිය අයකර ගැනීම සඳහා ඉහත කී උකස් බැඳුම්කර මගින් බැංකුව වෙත උකස්කරන ලද මෙහි උපලේඛනයේ සවිස්තරාත්මකව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර එන්. යූ. ජයසූරිය මහතා මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි (මෙහි මින්මතු සාමූහිකව "ප්‍රධාන පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) සංශෝධිත 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මතකර සිටිනු ලැබේ.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඔය පළාත කෝරළේ, හාවඑළිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, නුවරඑළිය මහනගර සභා සීමාව ඇතුළත හාවඑළිය පිහිටා ඇත්තා වූ ද, "නුවරඑළිය සෙන්ට්‍රල්" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම වන්නා වූ ද, ප්‍රමාණයෙන් පර්චස් විස්සක් වූ ද (පර්. 20)

*උතුරට* : හමුදා පාර සහ කැලෑ රක්ෂිතය ද;

*නැගෙනහිරට* : විජේරත්න යන අයගේ නිවස දෙසට වූ මාර්ගය සහ කැලෑ රක්ෂිතය ද;

*දකුණට* : දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් ඉඩම ද;
*බටහිරට* : හමුදා පාර සහ කැලෑ රක්ෂිතය ද;

යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද නුවරඑළිය ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ LDO A 20/29 දරන වෙළුම/පත්තිරුව යටතේ ලියාපදිංචි වී ඇති බෙදා වෙන්කළ ඉඩම් කොටස සහ ඒ මත වූ වෙනත් සියලු දේ ද වේ.

මෑතකාලීන මැනීමකට අනුව ඉහත කී ඉඩම පහත පරිදි විස්තර වේ; එනම් -

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඔය පළාත කෝරළේ, හාවඑළිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, නුවරඑළිය මහනගර සභා සීමාව ඇතුළත හාවඑළිය අංක 7 දරන කොට්ඨාසයේ පිහිටා ඇත්තා වූ ද, බලයලත් මිනින්දෝරු එස්. පී. රත්නායක විසින් සාදන ලද 1998.02.26 දින අංක 1389 දරන පිඹුරේ "ස්ටේට් ලැන්ඩ්" යනුවෙන් හඳුන්වනු ලබන සහ "ලොට් 1" ලෙස ලකුණුකර නිරූපණයකර ඇත්තා වූ ද ප්‍රමාණයෙන් පර්චස් විස්සක් වූ ද (පර්. 20).

*උතුරට* : එම ඉඩමේම ඉතිරි කොටස ද;
*නැගෙනහිරට* : අඩි 10ක් පළල පාර ද;
*දකුණට* : එම ඉඩමේම ඉතිරි කොටසක් ද;
*බටහිරට* : ඉහත කී අංක 1389 දරන පිඹුරේ සඳහන් මැනීම සහ විස්තරය ප්‍රකාරව හැව්ලොක් ඩ්‍රයිව්හි වීදි රේඛාව ද.

යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද ඉහත කී "ලොට් 1" දරන බෙදා වෙන්කළ ඉඩම් කොටස සහ ඒ මත වූ වෙනත් සියලු දේ ද වේ.

තව ද, උපකරණ සමඟ විදුලි සැපයුම් පද්ධතිය, ජල සැපයුම් පද්ධතිය, විදුලි සංදේශ උපකරණ සහ වායු සමීකරණ උපකරණ ඇතුළු ඉහත සවිස්තරාත්මකව විස්තර කර ඇති ඉහත කී ඉඩම් කොටසට දැනට පවතින හෝ මෙහි මින්මතු කලින් කළ සවි කරනු ලැබිය හැකි හෝ ස්ථිරව එකතු කරනු ලැබිය හැකි එක්ව හා වෙන් වෙන් වශයෙන් වූ සියලු නිශ්චල යන්ත්‍රාගාර සහ යන්ත්‍රෝපකරණ, උපකරණ, සවිතුරු, සවිකිරීම් සහ සේවාවන් ද සමඟ වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්,
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී.

07-704

**ලංකා බැංකුව**

## 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන පනතින් හා 2000 අංක 54 දරන පනතින් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2024.01.08 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

ප්‍රසිද්ධ නොතාරිස් බන්දුමති බෝධිනායක රණසිංහ විසින් සහතික කරන ලද 2013.12.06 දිනැති අංක 7144 දරන උකස් බැඳුම්කරය, ප්‍රසිද්ධ නොතාරිස් නදීෂා තරංගනී පතිනායක විසින් සහතික කරන ලද 2017.06.09 දිනැති අංක 3350 දරන උකස් බැඳුම්කරය අනුව ස්ථිර අයිරාව මත 2023.11.30 දිනය තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රු. 12,927,328.76ක (රුපියල් එක්කෝටි විසිනව ලක්ෂ විසිහත් දහස් තුන්සිය විසිඅටයි ශත හැත්තෑ හයක්) මුදලක් සමග රු. 10,000,000.00ක (රුපියල් මිලියන දහයක්) මුදලක් මත වසරකට සියයට විසිහතරයි දශම දෙකයි පහක් (24.25%) බැගින් 2023.12.01 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තවත් පොළියක් ද, 1 වන ණය මත 2023.11.30 දිනය තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රු. 5,132,014.81ක (රුපියල් මිලියන පහයි එක් ලක්ෂ තිස්දෙදහස් දහහතරයි ශත අසූඑකක්) මුදලක් සමග රු. 3,327,881.79 ක (රුපියල් මිලියන තුනයි තුන් ලක්ෂ විසිහත් දහස් අටසිය අසූඑකයි ශත හැත්තෑ නවයක්) මුදලක් මත වසරකට සියයට විසිතුනයි දශම දෙකයි පහක් (24.25%) බැගින් 2023.12.01 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තවත් පොළියක් ද, 2 වන ණය මත 2023.11.30 දිනය තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රු. 561,218.68ක (රුපියල් පන් ලක්ෂ හැටඑක් දහස් දෙසිය දහඅටයි ශත හැටඅටක්) මුදලක් සමග රු. 498,316.88 ක (රුපියල් හාර ලක්ෂ අනූඅට දහස් තුන්සිය දහසයයි ශත අසූඅටක්) මුදලක් මත වසරකට සියයට හතරක් (4%) බැගින් 2023.12.01 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තවත් පොළියක් ද, 3 වන ණය මත 2023.11.30 දිනය තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රු. 4,182,519.13ක (රුපියල් මිලියන හතරයි එක් ලක්ෂ අසූදෙදහස් පන්සිය දහනවයයි ශත දහතුනක) මුදලක් සමග රු. 3,604,584.79ක (රුපියල් මිලියන තුනයි හය ලක්ෂ හාර දහස් පන්සිය අසූහතරයි ශත හැත්තෑ නවයක්) මුදලක් මත වසරකට සියයට හයයි දශම නවයයි තුනක් (6.93%) බැගින් 2023.12.01 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තවත් පොළියක් ද කොළඹ 11, පීපල්ස් පාක්, UG/52 හි පිහිටි M/S Chemmadu Book Centre වෙතින් අයවිය යුතුව ඇත.

එකී 2013.12.06 දිනැති අංක 7144 දරන උකස් බැඳුම්කරය, 2017.06.09 දිනැති අංක 3550 දරන උකස් බැඳුම්කරය අනුව ස්ථිර අයිරාව මත රු. 12,927.328.76ක (රුපියල් එක්කෝටි විසිනව ලක්ෂ විසිහත් දහස් තුන්සිය විසිඅටයි ශත හැත්තෑහයක්) මුදලක් ද, 1 වන ණය මත රු. 5,132,014.81ක (රුපියල් මිලියන පහයි එක් ලක්ෂ තිස්දෙදහස් දහහතරයි ශත අසූඑකක්) මුදලක් ද 2

වන ණය මත රු. 561,218.68ක (රුපියල් මිලියන පහයි හැටඑක් ලක්ෂ දෙසිය දහඅටයි ශත හැටඅටක්) මුදලක් ද 3 වන ණය මත රු. 4,182,519.13ක (රුපියල් මිලියන හතරයි එක් ලක්ෂ අසූදෙදහස් පන්සිය දහනවයයි ශත දහතුනක්) මුදලක් ද 2023.12.01 දින සිට විකිණීමේ දිනය තෙක් එකී පරිදි පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට, කොලොන්නාව, විහාර මාවත, අංක 50/3, ටී ඇන්ඩ් එච් ඔක්ෂන් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා හට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වන වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළකිරීමට ලංකා බැංකුව නගර කාර්යාල ශාඛාවේ ප්‍රධාන කළමනාකාර මහත්මිය හට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, කොළඹ ලියාපදිංචි කොට්ඨාසයේ, සියනෑ කෝරළයේ, අදිකාරිපත්තුවේ, ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ (නමුත් වඩා නිවැරදි කැළණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය) කැළණිය ප්‍රාදේශීය සභා සීමාවේ (දළුගම උප කාර්යාලය) කැළණිය අංක 256 බී දරන ග්‍රාමසේවා නිලධාරි කොට්ඨාසයේ, හුනුපිටියේ හි පිහිටි "කමතගොඩැල්ල" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එෆ්. ආර්. සමරසිංහ විසින් සාදන ලද 2007 ඔක්තෝබර් 21 සහ 23 දිනැති අංක 5344 දරන මිනුම් පිඹුරේ මායිම් නිරූපණය කර ලොට් 1 ලෙස ලකුණු කළ බෙදන ලද්දා වූ විස්තර කළ එකී ලොට් 1, උතුරට : බලයලත් මිනින්දෝරු සී. ද එස්. ගුණතිලක විසින් සාදන ලද අංක 2468 දරන පිඹුරේ ලොට් 1 ද, නැගෙනහිරට : කලින් ඒ. ජේ. සී. පෙරේරාගේ ඉඩම ද, දකුණට : බලයලත් මිනින්දෝරු කේ. ඩී. ෆීලික්ස් පෙරේරා විසින් සාදන ලද අංක 1343 දරන පිඹුරේ ලොට් 1C ද, බස්නාහිරට: ලොට් 2 සහ පාර (අංක 991 දරන පිඹුරේ ලොට් 9) ද, මායිම්ව එකී අංක 5344 දරන පිඹුර අනුව පර්චස් දහයයි දශම පහයි හයක් (පර්. 10.56) ප්‍රමාණයෙන් යුත් ඉඩම සමඟ එහි පිහිටි ගහ කොළ, වැවිලි, ගොඩනැගිලි සහ සියලු දේ සමග වේ. මෙම ඉඩම මහර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 20/110 හි ලියාපදිංචි කර ඇත.

එකී හුනුපිටියේ හි පිහිටි "කමතගොඩැල්ල" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එෆ්. ආර්. සමරසිංහ විසින් සාදන ලද 2007 ඔක්තෝබර් 21 සහ 23 දිනැති අංක 5344 දරන මිනුම් පිඹුරේ මායිම් නිරූපණය කර ලොට් 1 ලෙස ලකුණු කළ බෙදන ලද්දා වූ විස්තර කළ එකී ලොට් 1, උතුරට : ලොට් 1 ද, නැගෙනහිරට : ලොට් 1 ද, දකුණට : බලයලත් මිනින්දෝරු කේ. ඩී. ෆීලික්ස් පෙරේරා විසින් සාදන ලද අංක 1343 දරන පිඹුරේ ලොට් 1C ද, බස්නාහිරට : පාර (අංක 991 දරන පිඹුරේ ලොට් 9) ද, මායිම්ව එකී අංක 5344 දරන පිඹුර අනුව පර්චස් අටයි දශම අටයි දෙකක් (පර්. 8.82) ප්‍රමාණයෙන් යුත් ඉඩම සමග එහි පිහිටි ගහකොළ, වැවිලි, ගොඩනැගිලි සහ සියලු දේ සමග වේ. මෙම ඉඩම මහර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 20/111 හි ලියාපදිංචි කර ඇත.

තව ද, බලයලත් මිනින්දෝරු කේ. ඩී. එස්. ආර්. පෙරේරා විසින් සාදන ලද අංක 991 දරන පිඹුරේ (පාරක් සඳහා වෙන්කළ) ලොට් 9 මත අන් අය හා සමාන මාර්ග අයිතිය ද වේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ආර්. ඩී. ඩී. රණසිංහ,
ප්‍රධාන කළමනාකාරිණි.

ලංකා බැංකුව,
නගර කාර්යාල ශාඛාව, කොළඹ.

07-729

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.